
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# කාටත් පාඩම් ගතහැකි කාලයක්! ඩිකන්ස් ලියා තැබූ යුගයයි මේ!

**ඉං**ග්‍රීසි මහා ලේඛක චාර්ල්ස් ඩිකන්ස්ගේ **Tale of Two Cities** (දෙනුවර අන්දරය) නම් නවකථාවේ පටන් ගැන්ම මට සිහිවෙයි. මෙම නවකතාව කියවා ඇති බොහෝ දෙනෙකු ඊට එකඟ වෙනවා නොඅනු මානය. (මෙම කලාප යේ පිටුවක ඩිකන්ස් මහතා ලියා ඇති ඒ ජේදය දක්වා ඇත.) එය මෙසේ ය:

"එය හොඳම කාලය විය. එසේම එය නරකම කාලය විය. එය ප්‍රඥාවේ යුගය විය. එය අන්ත මෝඩකමේ යුගය ද විය. එය විශ්වාසයේ යුගයයි. එසේම එය අවිස්වාසයේ යුගය ද විය. අපි දෙව්ලොව දෙසට යමින් සිටියෙමු. එහෙත් ඊට ප්‍රති විරුද්ධ දිසාවට දැන් අපි ගමන් කරන්නෙමු."

ඩිකන්ස් ඉහතකී වාක්‍ය පෙළ දෙනුවර අන්දරය පොතේ මුළටම එකතුකළේ ඔහුගේ යුගයේ කතාව කියන්නටම පමණක් නොවේ. අනාගතයේ උදාවන කාලය ගැන ද කියන්නට ය. අද ලොව විවිධ රටවල සිදුවන විවිධ සිද්ධීන් දකිනවිට මේ සැබැවින්ම උදාවී ඇත්තේ ඒ ඩිකන්ස් යුගය බව පැහැදිලි ය. මේ නොබෝදා තරුණ අසහනයේ විනාශකාරී පැත්ත පෙන්වමින් ලන්ඩනයේත් එංගලන්තයේ විවිධ පළාත්වලත් වූ කළකෝලහල ගැන සඳහන් කරමින් එක් වයෝවෘද්ධ ඉංග්‍රීසි ජාතිකයෙක් තම කළකිරීම පළකළේ "මේ දැන් පැමිණ ඇත්තේ ඩිකන්ස් යුගයයි " (Dickensian Era is now here for us) යනුවෙන් කියමිනි.

ලොව විපරීත කාලයකට මුහුණ දී ඇත. හොඳට තිබුණු රටවල් කඩා වැටේ. ධනවත් රටවල් ආර්ථික අහේනියට ගොදුරුව බංකොළොත් වෙයි. රජයයන් මුලින්ම ඉගිලී යයි. පාලකයෝ රට හැර පැන යති. ඔවුන් පසුපස එළවන විරුද්ධවාදීන් ය.

මේ සියළු සිදුවීම් අතරේ සැබැවින් පෙනෙන දෙයක් වෙයි. එනම් ඉරාකය, ඊජිප්තුව, සිරියාව සහ දැන් ලිබියාව ආදී රටවල් හි ඇති ආණ්ඩු බිඳවැටීමට වූ හේතූන් අතර සතුරු ආක්‍රමණවලට වඩා ඒ ඒ පාලකයන්ගේ පාලනයේ තිබුණු අක්‍රමිකතාවන්ය. එසේම ඒ පාලක පෙලැන්තිය සහ ඒ පවුල්වල අය රටේ ධනය තම පරිහරණයට ගැනීමයි. මහා පරිමාණයේ දූෂණ හා නාස්තියයි. බොහෝ කලක් බලයේ සිටින විට පාලකයන්නට මුල අමතක වෙයි. ඉරාකය, ඊජිප්තුව, සිරියාව හා දැන් ලිබියාවටද සිදුවූයේ එයයි. ජනතාව කෙරෙහි මුලදී තිබුණු බැඳීම අඩුවෙයි. සාමාන්‍ය මිනිසා පෙලන්නට පටන්ගනී. ක්‍රමයෙන් වර්ධනය වන ජන අසහනය හා අප්‍රසාදය ගැන තැකීමක් නැති වෙයි. අවසානයේ තමන්ගේ ආරක්ෂක පිරිස හැරුණ විට රටේ බහුතරය තමන්ගෙන් දුරස් බව පාලකයින්ට වැටහෙන්නේ කැරැල්ලක් මතු වූ විටය. එවිට කුමන මහන්සියක් ගත්තද රටේ වාසය කරන්නට බැරි තත්වයක් එයි. බලය අත්හැර යන්නටම සිදුවෙයි. මෙය ලොව ඕනෑම රටක තවත් ඉදිරියට සිදුවිය හැකිය. ඒ නිසා මෙම භයානක තත්වය තේරුම් ගෙන සිහිනුවණින් කටයුතු කිරීම කුමන පාලකයා වුවද අද තරයේ සිහිතබාගත යුතු කරුණකි.

# උපෙක්ඛා - උපේක්ෂාව - සමචිත්තතාව
# Upekkha - Upeksha - Equanimity

**සි**යළු දෙයෙහි නොපවත්නා බව යමෙකු හඳුනාගත් කල හේ කිසිදු ලෞකික ධර්මතාවකින් මුලා නොවන්නේ ය. මක්නිසා ද ඒවා මත ඔහු ජීවත් නොවන බැවිනි.

යමක් ලද කල්හි ඉන් උද්දාම යට පත්නොවන ඔහු, නොලද කල්හි කනස් සල්ලට ද පත් නොවන්නේය.

කීර්තිය ඔහු තුළ ආඩම්බරය ඇති නොකරවයි. අපකීර්තිය තුළ ඔහු පීඩාවට ද පත් නොවෙයි.

දොස් ඇසීමෙන් ඔහු නොකැළඹෙන්නා සේම, ප්‍රශංසා වෙන්ද දිනාගත නොහැකිය. සතුට කෙරෙහි ආකර්ශණයක්ද, වේදනාවෙන් පලා යාමක් ද ඔහු තුළ නොවේ.

මෙසේ සියල්ල මධ්‍යස්ථ සිතින් ඉවසන තැනැත්තාට ඇළුම්කරන දෑ හා නොකරන දෑ යයි කියා දෙකක් නොමැත. මන්ද, ඒ සියල්ල තුළ ඔහු කිසිදු වෙනසක් නොදක්නා බැවිනි.

ඔහු කිසිවකින් පරාජය කළ නොහැකි ය.

*Praise & blame, gain & loss, pleasure & sorrow, come and go like the wind. To be happy, rest like a great tree in the midst of them all.* **- The Buddha**

**W**hen one identifies the impermanence of everything around him, he would not be deceived by alluring mundane conditions, for he lives not on them.

When he achieves something, he would not be elated by it, nor feel dejected being deprived of it.


Fame does not make him proud, nor defamation troubles him. Blame cannot ruffle him,praise will not win him over.

He will not be attracted to the joy, nor will he be running away from sorrow.

Thus, one who is full of equanimity neither longs for materials nor detests them. Nothing makes any difference to him. Such person cannot be defeated.

♦ ***ජාලිය සිරිවර්ධන***
**Munich, Germany**

# ධර්ම දේශනා කාලීන විය යුතුයි!



**ප**රිණාමවාදයට අනුව අදින් වසර මිලියන 4500කට පෙර ඇතිවූ පෘථිවියේ මුල්ම ජීවියා බිහිව ඇත්තේ වසර මිලියන 3500 කට ඉහතදීය. මුලින්ම පහළ වූ ඒක ශෛලික සරල ජීවීන් විවිධාකාර වෙනස්වීම්වලට ලක්වී අද පවතින සියළුම ගහ කොළ, සතා සිව්පාවා හා මිනිසාද ඇතිවී තිබේ. මෙහිදී වානරයාගෙන් මිනිසා ඇතිවීමේ ක්‍රියාවලිය ආරම්භ වී ඇත්තේ අදින් වසර මිලියන 4 කට පමණ පෙර දී ය. එසේ ඇතිවූ මිනිසා ශිෂ්ඨත්වයට පත්ව වසර දස දහසකට වඩා ගතවී නැත. මේ සියළු කරුණු පිළිගැනීමට ඇති සාක්ෂද වෙති.

ඒ අනුව අද ලොව පුරා පැතිරී ඇති හැම දියුණු නිෂ්පාදනයක් මෙන්ම, හැම දර්ශනයක්ම බිහිව ඇත්තේ මෙම වසර 10000 ක කාල පරාසය තුළ ය. මක්නිසාද ඊට පෙර ශිෂ්ඨ මිනිසුන් ලොව නොසිටි බැවිනි. එසේ නම් බෞද්ධ ඉගැන්වීම් වල සඳහන් වන අටවිසි බුදුවරයන් මෙන්ම, බෝධිසත්ව ආත්ම සියල්ල ද ජීවත්ව සිට ඇත්තේ ද මේ කාලය තුළම විය යුතු ය.

අද විවිධ මාධ්‍යයන් ඔස්සේ විකාශනය කරනු ලබන ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා ද බොහෝ ය. මෙම අවස්ථාවලදී අපායයන්, දිව්‍යලෝක, යක්ෂයින්, ප්‍රේතයින්, භූතයින් හා දෙවියන් ගැනද, ඒවාට සම්බන්ධ සිද්ධීන් ගැන මෙන්ම, විශාල කාල පරාසයන් පිළිබඳවද සඳහන් කෙරේ. අපේ පසිඳුරන්ට ගෝචර නොවූ පමණින් මේ සියල්ල අසත්‍යයයි බැහැර කිරීමට තරම් අප සැහැසිවිය යුතු නැත. එහෙත් අද ලෝකය දියුණුය. දැනුමෙන් පිරී පවතී. ජනතාව තුළ ද විචාරශීලී අදහස් ඇත. මේ අතර බුදු දහමෙහි එන කර්මය හා පුනර්භවය වැනි සංකල්ප සෘජුවම බැහැර කරන අය ද, ඒවා ගැන සැක කරන අය මෙන් ම, ඒවායේ සත්‍ය අසත්‍යතාව දැනගැන්ම සඳහා ගවේෂණ කරන අය ද ඇත.

එහෙත් ධර්මදේශනා හා දහම් ලිපි මගින් ඉහත සඳහන් කළ අදහස්ම නිතර නිතර ප්‍රකාශ වනවිට උගත් පරපුර තුළින් බුදුදහම කෙරෙහි ඇති උනන්දුව අඩුවී යාමටද ඉඩ තිබේ. ඇතැම් විට අතීතයේ සිටම පැවති වෙනත් ඇදහිලි හා විශ්වාසයන්ගේ ගණයටම බුදුදහම ඇතුළත් කිරීමට ද ඔවුන් පෙළඹෙනු ඇත.

අයින්ස්ටයින් සාපේක්ෂතාවාදය සොයා ගත්තේ ය. බුදුන්වහන්සේ ඊට වඩා ගැඹුරු පරහිතකාමී දර්ශනයක් වන චතුරාර්ය සත්‍යය සොයාගත්හ. එහි එන දුක හා සම්බන්ධ දේ, දුකට හේතුවූ තෘෂ්ණාව මෙන්ම, දුකින් මිදීම වූ උත්පත්තිය වලක්වාගැනීම හෙවත් නිවන යන දේවල ඇති සත්‍යතාව සාමාන්‍ය පුද්ගලයෙකුට වුවද වටහා ගත හැකිය. මේ අතර ප්‍රඥාවෙන් අග තැන්පත් බුදුන් වහන්සේ විසින් තම නුවණ මෙහෙයවා පසිඳුරන්ටද ගෝචර නොවන මෙහි සතර වන සත්‍යය හෙවත් දුකින් මිදීමේ මාර්ගයට ඇතුළත්වීම පිළිබඳව සිත දියුණු කරමින් එහි අවසානය දක්වා ගමන්කිරීම පිළිබඳවද පැහැදිලිකර දී තිබේ. මේ අනුව බුදු දහමේ ප්‍රකාශ වන වඩාත් ගැඹුරු දේවල් සිත දියුණු කරගනිමින්ම අවබෝධ කරගත යුතු පසිඳුරන්ට ද අසුනොවන දේවල් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මේ නිසා අද බොහෝ උගතුන්ගේ සැකයට භාජනය වී ඇති කර්මය හා පුනර්භවය පිළිබඳව ද, සිත දියුණු කර ගැන්ම පිළිබඳව ද, සරලව පැහැදිලි කර, ඔවුන්ගේ සැක දුරුවන අන්දමට සකස් කළ ධර්මදේශනා හා සාකැච්ඡා වැඩි වැඩියෙන් ප්‍රචාරය කිරීම අද කාලීන අවශ්‍යතාවක් බවද පැවසිය යුතු ය.

***විශ්‍රාමලත් විදුහල්පති එස්. ජයසුන්දර - උඩුගම Sri Lanka***

# ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

## හිතොපදේශයෙන්

**ආපද් පුන්මාර්ගගමනෙ කාර්‍ය්‍යකාලාත්‍යයෙෂු ච**
**කල්‍යාණවචනං බ්‍රෑයාදපෘෂ්ටොපි හිතො නරඃ**

***අර්ථය*** : **විපතක් ඇති විටද, නොමග යන විටද, කළයුතු වේලාව ඉක්මවා යනවිටද, නොවිමසුව ද, හිතවත් මිනිසා හොඳ වචනයක්ම කියන්නේ ය.**

**ලො**ව පහළ වූ උදාර මිනිසුන් බොහෝ කැපකිරීම් කර ඇත්තේ හුදෙක් ආත්මාර්ථය සලසා ගැන්ම සඳහාම නොවේ. මුළු මහත් මිනිස් වර්ගයාගේම යහපත ප්‍රාර්ථනා කරගෙන ය. ලොව වරෙක තැවෙන්නේත්, වරෙක නිවී සැනසෙන්නේත් මිනිසා නිසාමය. මිනිසාගේ සිතුවිලි නපුරට යොමුවී මිනිසාට එරෙහි වූ දාට ලොව ගිනිගෙන දැවෙනවා ඇත. මිනිසා මිනිසා කෙරෙහි සෙනෙහසින් පිබිදුණු දාට ලොව නිවී සැනසීමට පත්වේ. එනිසා ලොව වාසනාවන්ත කිරීමටත්, ලොව කෙනෙකුට ජීවත්වීමට අපහසු තැනක් කිරීමටත් හැකියාව පවතින්නේ මිනිසා සතුව ය.

කෙනෙකු ආකාර තුනක් වරද්දා ගැනීම් කරගන්නා විට ඒ වැරදුණ කෙනාගේ ඇරයුමකින් තොරවම එම වැරදි නිවැරදි කරගැනීම සඳහා වැරැද්ද යහපත් ලෙස පෙන්නා දෙන තැනැත්තා හිතවතෙකු බව මෙම පද්‍යය පෙන්වාදෙයි.

කෙනෙකුට ජීවිතයේ උතුම් සැනසුම හා සතුට ලබා ගතහැකි වන්නේ අධ්‍යාත්මික සුන්දරත්වයට ළංවීමෙනි. ඒ සඳහා ක්‍රියා කළ හැක්කේ මානව දයාව, සානුකම්පිකබව, කෘතවේදීබව හා මිත්‍රත්වය ආදි උදාර ගුණධර්මවලින් පිරිපුන් කෙනෙකුට පමණකි.

මිනිසෙකු උපදින්නේ තනිව වුවද ඔහුට තනිවම ජීවත් වීමට නොහැකි ය. එනිසා ඔහුට අන් අයගෙන් උදව් උපකාර අවශ්‍ය වේ. පාලුව, හුදකලාව හා කාන්සිය මෙන්ම ජීවන බර සැහැල්ලුකර ගැනීමට වෙනත් අයගේ සහාය අවශ්‍ය වේ. එසේම ගැටළුවක් කරදරයක් පැන නැගී විටක එය විසඳාගැනීමට තවත් කෙනෙකුගේ පිහිට පතන්නට සිදුවේ. එබැවින් මිනිසු සමාජය තුළ අපමණ ගැටළු වලින් පැනනගින දුක, තාපය සමනය කරගැනීමට සත්පුරුෂයන්ගේ සහාය උදව් උපකාර හා උපදෙස් විශේෂයෙන් පිටුවහලක් වේ. ජීවිතයේ අරමුණු බෙහෙවින් සංකීර්ණ තත්වයක් තුළ පවතින සමාජයක ජීවත්වන පුද්ගලයාගේ ජීවිතයද එම සංකීර්ණ බව නිසාම ව්‍යාකූලත්වයට පත්වන්නේය. වත්මන් සමාජයේ ඇතැම් අයගේ ජීවිත අවුල් වූ නූල් පන්දුවක් මෙන් නිවැරදි කර ගැන්මට නොහැකි අන්දමට සංකීර්ණ වී ඇත.

එහෙත් එවැනි වැරදි මග යන්නෙකුගේ ජීවිතය නිසිමගට ගැනීමට, එය අවබෝධකර දීමට යමෙකු උපකාර කරන්නේ නම් එය ඔහුගේ ජීවිතය ප්‍රබෝධමත් කරගැනීමට බෙහෙවින් බලපාන බව කිව හැකි ය.

නොයෙක් අඩුපාඩු මධ්‍යයේ සිට අපි එකිනෙකාගේ අඩු ලුහුඬුකම් සොයන්නට, හරි වැරදි සොයන්නට කාලය මිඩංගු කිරීම අමනොඥ ක්‍රියාවකි. තමන් සමග ජීවත්වන කෙනෙකුට හදිසි කරදරයක් අත්වැරැද්දක් සිදුවූ වෙලාවක එය යටි හිතේ තබාගෙන ඒ ගැන සතුටු වන අය අප අතර සිටිතත් සිනාමුසු මුහුණින් එකට ජීවත්වෙමින් එකට කටයුතු කළත් සිතිවිලි වශයෙන් ඔවුන්ගේ අදහස් බොහෝ දුරස් ය. මෙවැනි අපූරු යාළුවන්ට වඩා කෙනෙකුට කරදරයක් ඇතිවූ විටෙක ඉන් ගොඩ ඒම සඳහා උදව් උපකාර කරන්නේ නම්, කෙනෙක් නිසිමග තෝරාගත් නොහැකිව වල්මත්ව නොමග යන විටක ඔහු කෙරෙහි සානුකම්පිකව බලා ඔහු නිසිමගට යොමුකරන්නේ නම්, හා නිසි කල කටයුතු ඉටුකර නොගෙන ජීවිතය අවුලක් කරගන්නා විටක නියමිත කලට නියමිත කාරණය නිමාකිරීමට උපදෙස් දෙන්නේ නම් ඔහුගේ පවුල සමබරතාවකින් පවත්වාගෙන යාමට හැකිවන්නේ ය. එ කල්හි ඔවුන්ගේ ජීවිතය හරවත් රසවත් එකක් බවට පත්වන්නේය. එනිසා මනඃකල්පිත ලෝකයන් මවාගෙන ඒවායේ සතුට සොයන්නට නොගොස් උතුම් හිතවතුනගේ සදුපදේශයන් පිළිපදිමින් නිසි මග යමින් නිවැරදි දැම කරන්නේ නම් ජීවිතයේ සතුට ළඟාකරගත හැකි ය.



♦ ***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***
**London Buddhist Viharaya**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**